**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2019 අප්‍රේල් 26** | **ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන** | **2019 අංක 02**

## ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතය

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. අදාලත්වය සහ විෂය පථය

1.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා දීමේදී, ගනුදෙනුකරුවන්ගෙන් අසාධාරණ ලෙස පොලී අයකිරීමෙන් ඔවුන් ආරක්ෂා කරගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතයක් හඳුන්වා දෙනු ලැබේ.

1.2 මෙම විධානය නිකුත් කළ දින සිට ප්‍රදානය කරනු ලබන සියළුම ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා මෙම විධානය අදාල වේ.

2. උපරිම පොලී අනුපාතය

2.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා අය කරනු ලබන පොලිය අනෙකුත් සියළුම ගාස්තු ද ඇතුලත්ව වාර්ෂිකව සියයට 35 කට (වාර්ෂික සඵල පොලී අනුපාතය) නොවැඩි විය යුතු ය.

3. ක්ෂුද්‍රමූල්‍ය ණය අර්ථ දැක්වීම

3.1 ස්වර්ණාභරණ, රජයේ සුරැකුම්පත් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවක, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක ඇති ස්ථාවර තැන්පතු ඇතුළුව යම් නිශ්චල හෝ චංචල දේපළක සුරැකුමකට එරෙහිව ප්‍රදානය කරන ලද ණය පහසුකම් හැර, ක්ෂුද්‍ර ව්‍යවසායන් පිහිටුවීම සහ කළමණාකරනය ඇතුළු ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා තනි පුදගලයින්ට/ කණ්ඩායම් ණය ක්‍රම යටතේ තනි පුද්ගලයින්ට ලබා දුන් ණය මෙමගින් අර්ථ දැක්වේ.

4. අර්ථ නිරූපණයන්

4.1 වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 15 ට අඩු සහ සේවක සංඛ්‍යාව 10 ට අඩු නිෂ්පාදන සහ සේවා අංශයෙහි නියුතු ව්‍යාපාර, "ක්ෂුද්‍ර ව්‍යවසායන්" ලෙස හැඳින්වේ.

(මූලාශ්‍රය: කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කළ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව)

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති